 ISSN 2362-0412

# උඩුනුවර ලංකාතිලක රජ මහ විහාරයේ ඓතිහාසිකත්වය හා විහාර චිත්‍ර පිළිබඳ විමසුමක්

එම්.පී. අනෝජා සමරසේකර

*පාලි හා බෞද්ධ අධ්‍යයනාංශය, මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨය, රුහුණ විශ්වවිද්‍යාලය*

*anojaudawattha@gmail.com*

**සාරසංක්ෂේපය**

මහනුවර දිස්ත්‍රික්කයට අයත් උඩුනුවර ලංකාතිලක රජමහා විහාරය පන්හල්ගල යනුවෙන් පුරාණයේ හඳුන්වන ලද පර්වතය මත පිහිටි ඓතිහාසික පුදබිමකි. ගම්පොළ යුගයේ ප්‍රථම රජු වන 4 වන බුවනෙකබාහු රජුගේ ඉල්ලීමකට අනුව රජුගේ අගමැති වූ සේනාලංකාධිකාරීතුමන් විසින් ඉදිකරන ලද්දකි. ස්ථාපතිරායර් නැමැති ශිල්පියාගේ නිර්මාණයක් වන මෙම ලංකාතිලක විහාරයේ නම, සේනාලංකාධිකාරී තුමන් විසින් තම නමේ කොටසක් වන ලංකා යන්නට තිලක යන කොටස එකතු කරමින් ලංකාවට ම තිලකයක් වන විහාරය යන අරුතින් ලංකාතිලක යනුවෙන් නම් කරන්නට ඇතැයි සිතිය හැකිය. විහාරයේ සැලැස්ම පිළිබඳ විමසන කළ පිහිටි ගල් තලාව ඔපමට්ටම් කොට විශාල ප්‍රමාණයේ කළුගලින් අත්තිවාරම සකස් කොට ඒ මත කළු ගල් හා ගඩොල් උපයෝගී කොට ගෙන මෙම සුවිසල් ගොඩනැගිල්ල ඉදිකර ඇති බව ශිලාලේඛනයේ සඳහන් වේ. ලංකාවේ ජාතික උරුමයක් වන ලංකාතිලක විහාරය පොළොන්නරුවේ පැවති ගෘහනිර්මාණ ශිල්පීය ක්‍රමය ආශ්‍රිත හින්දු ආභාසය ද මුසු කරගනිමින් දේශීය සම්ප්‍රදාය ද සිතෙහි තබාගෙන සැලසුම් කරන ලද්දකැයි කිව හැකිය. ලංකාතිලක විහාරය ඈත සිට බලන්නකුහට තුන් මහල් අයුරින් නිර්මාණය වී ඇතැයි පෙනී ගිය ද දැනට අපට දැකගත හැක්කේ පහත මාලය හා උඩුමහලය පමණි. පර්වත සෙල් ලිපියට අනුව මෙය ආරම්භයේ මහල් සතරකින් යුක්තව පැවත ඇති අතර මෙම මහල් හතරෙහි තැන්පත් තරන ලද පූජණීය වස්තු පිළිබඳ ශිලා ලේඛනයේ සඳහන් වන බව මෙම පර්යේෂණයේ දී සොයාගත හැකිවිය. ඒ අනුව මෙහි පවත්නා ඓතිහාසිකත්වය පිළිබඳ ජන විශ්වාසයන් මගින් සෙල්ලිපි වල සඳහන් ඓතිහාසික කාරණා මගින් සනාථ කිරීම මෙම පර්යේෂණයේ දී සිදුකෙරේ. ඓතිහාසික ලංකාතිලක රජමහා විහාරයේ බිතුසිතුවම් ද සුවිශේෂී වන අතර බිත්තියේ ඉහලින් ම මල් මෝස්තරයක් දැකිය හැකි අතර එයට පසුව සූවිසි විවරණය, බෝසත් රූප පෙළක් දැකිය හැකිය. එමෙන් ම මෙහි පිරිනිවන් මංචකය ද සිරිපා සටහන ද සුවිශේෂී නිර්මාණ වේ. විශේෂයෙන් ම පුරාවිද්‍යා මූලාශ්‍රයක් ලෙස ලංකාතිලක පර්වත ශිලාලේඛනයට අනුව මෙන් ම සාහිත්‍ය මූලාශ්‍ර හා ජනප්‍රවාදයන් මුල්කොට ගෙන ලංකාතිලක රජමහා විහාරයේ පවතින්නා වූ ඓතිහාසික වැදගත් කම හා විහාර චිත්‍රවල පවතින්නා වූ සුවිශේෂීතාව පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීමට මෙම අධ්‍යයනයේදී සිදු කෙරිණි.

*ප්‍රමුඛ පදඃසෙල් ලිපි, පන්හල්ගල, ලංකාතිලක,ඓතිහාසික විහාර චිත්‍ර*